ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

| |
|---|
| අනු අංකය :<br>For office use only |

**ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයේ පවත්වන සංස්කෘතික අධ්‍යාපන වැඩ පිළිවෙලට අදාළ අතිරේක කොන්දේසි මාලාව 2016-2017**

1.0 සිකුරාදා දිනවල පහත සඳහන් වෙලාවන් තුල පන්ති පැවැත්වෙනු ඇත.

- හතර (4) සිට අට (8) වසර දක්වා පන්ති - **පෙ ව 8:00 සිට දහවල් 11:10 දක්වා**
- දෙක (2) වසර සහ තුන (3) වසර පන්ති - **දහවල් 12.00 සිට ප ව 2.50 දක්වා**
- එක (1) වසර සඳහා පන්ති - **ප ව 3:35 සිට සවස 6:15 දක්වා**

ඉහත සඳහන් කාල වේලාවන් ට අනුකුලව දරුවන් රැගෙන ඒම සහ රැගෙන යාම දෙමාපිය භාරකරුවන්ගේ වගකීමකි. **ප.ව. 6.15 න් පසු** කොන්සල් ජනරාල් කාර්යාලය සහ එම පරිශ්‍රයේ දරුවන් කිසි විටෙකදී රැදී නොසිටිය යුතුය.

2.0 අධ්‍යාපන කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා දරුවන් දිනපතා පාසලට පැමිණීම අත්‍යවශ්‍ය වනු ඇත. අධ්‍යයන වසර ඇතුලත පැවැත්වෙන පන්ති ප්‍රමාණයෙන් **70% ක පන්ති සඳහා ( පන්ති 20 කට )** සහභාගී නොවන දරුවන් හට වර්ෂ අවසාන පරීක්ෂණයට ඉදිරිපත් විය නොහැකි බවත් එමගින් ඔහුගේ/ඇයගේ ඉහල පන්තියට අනුගත කිරීම සිදු නොකෙරන බවද සලකන්න

3.0 පෙර දැනුම් දීමකින් තොරව නොකඩවා **දින දෙකක්** පාසලට නොපැමිණෙන දරුවන් පාසල හැර ගියාසේ සලකනු ඇත. එම දරුවන් නැවත පාසලට ඇතුලත් කරවීමට අවශ්‍ය නම් ඊළඟ පාසල් වාරයේදී අලුත් ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ යුතුය. පසුව දැනුම් දීම වලංගු නොවන බව සලකන්න. දරුවන්ගේ නොපැමිණීම සම්බන්ධ සියලුම දැනුම් දීම් දහම් පාසලේ විද්‍යුත් තැපැල (email ) ලිපිනය හරහා හෝ ලිඛිතව දැනුම් දිය යුතුය.

4.0 දෙමාපියන් තමන්ගේ වාහන කොන්සල් ජනරාල් කාර්යාලයට යාබද මාර්ග වලට (අමුණා ඇති සිතියම බලන්න) අවතීර්ණ නොකර වෙනත් නීත්‍යානුකුලව නතර කල හැකි ස්ථානයක නවතා දරුවන් පාසලට රැගෙන එම සහ දරුවන් රැගෙන යාම කල යුතුය.

5.0 ද්විත්ව නවතනය (double parking), පදික වේදිකාව මත වාහනය නැවැත්වීම සහ දරුවා එන තෙක් පාරේ අනෙක් පස වාහනය නවතා ගෙන සිටීමෙන් සපුරා වැලකී සිටිය යුතුය.

6.0 තම වාහනය නැවත්වීමේදී අවට නිවැසියන් හට කිසිම අයුරකින් අවහිර නොවන අයුරින් කටයුතු කල යුතුය.

7.0 සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය මගින් පනවා ඇති කොන්දේසි මාලාවට එකඟ වන බවටත් දහම් පාසැලේ දූ දරුවන් සහ දෙමාපියන් සඳහා පනවා ඇති විනය නීති මාලාව පිළිපදින බවටත් ඉහත සඳහන් එක් කොන්දේසියක් හෝ කඩකරන පළමු අවස්ථාවේදීම දරුවාගේ දහම් පාසලේ ශිෂ්‍යභාවය අහෝසි කිරීමට දහම් පාසලේ සංවිධායක මණ්ඩලයේ සහ අනුභද්ධිත දෙමාපිය කමිටුවට පූර්ණ බලය අනුගත කර ඇති බව පිලි ගන්නා අතර කිසිම කාරණයක් මත දරුවා නැවත දහම් පාසලට ඇතුලත් කර නොගන්න බවද පිලි ගනිමි. තවද, මෙම ක්‍රියා පරිපාටිය සම්භන්ධයෙන් දහම් පාසලේ සංවිධායක මණ්ඩලයේ සහ අනුභද්ධිත දෙමාපිය කමිටිවේ තීරණ අවසන් තීරණ බවද පිලිගනිමි.

කොන්සල් ජනරාල් කාර්යාල භූමිය තුල සහ අවට ප්‍රදේශය තුල කිසිම ආකාරයක වෙළඳ ප්‍රචාරක පත්‍රිකා බෙදාහැරීම හෝ ඒ හා සම්බන්ධ කටයුතු සඳහා අනුග්‍රහය දැක්වීමෙන් වැළකිය යුතුය.

මව / පියා / භාරකරු ගේ නම: ..............................................................................................

දරුවාගේ නම: ........................................................................................ ලි.ප. අංකය: .............................

ජංගම දුරකථන අංකය: .....................................................

ඔබගේ මෝටර් රථයේ / රථ වල වර්ගය, ලියාපදිංචි එමිරටය සහ අංකයන් ;

1. ලියාපදිංචි අංකය: ........................... එමිරටය:.......................... වර්ගය: ........................... වර්ණය:...........
2. ලියාපදිංචි අංකය: ........................... එමිරටය:.......................... වර්ගය: ........................... වර්ණය:............

අත්සන:............................................................... දිනය:...........................................

මුල් පිටපත: ඩුබායි දහම් පාසල
අනු පිටපත: දෙමාපියන් හට